# අනුරාධපුර ගල්කිරියාගම, වනසිංහාරාම රජමහා විහාරයේ සිතුවම් පිළිබඳ අධ්‍යයනයක්

**අශෝකා සිරිවර්ධන[1], සමීර ප්‍රසංග[2*],චන්දිම බණ්ඩාර අඹන්වල[3]**

[1] ප්‍රධාන පුස්තකාලය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

[2] ඉතිහාස අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ. [3]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

*sameeraprasanga1983@gmail.com

ප්‍රමුඛ පද : සූවිසි විවරණය, බුද්ධ චරිතය, ජාතක කථා, නෙළුම් මල් මෝස්තර

## හැඳින්වීම

අනුරාධපුර, පලාගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගල්කිරියාගම වනසිංහාරාම රජමහා විහාර මහනුවර අවධියේ සිතුවම් සහිත විහාරයකි. කැකිරාව සිට ගලේවෙල දක්වා ගමන්කරන මාර්ගයේ ආඬියාගල මංසන්ධියෙන් ගල්කිරියාගම දක්වා වැටී ඇති මාර්ගයේ කිලෝ මීටර් හතරක් පමණ ගමන් කොට ගල්කිරියාගම හන්දියෙන් වමට හැරී තවත් කිලෝමීටර් හතරක් පමණ ගමන් කළ විට මෙම විහාරස්ථානයට ළඟා විය හැකි ය. අලංකාර ලෙන් විහාරයක් වන මෙය බ්‍රිතාන්‍ය පාලකයින්ගේ ද අවධානයට ලක් ව ඇත. පිළිම ගෙය ලෙන් විහාර සම්ප්‍රදායට අයත් ය. ලෙන් විහාරය දිග මීටර් පහළොවක් පමණ ය. උපරිම උස මීටර් හතරක් වන අතර පළලින් මීටර් තුනකි. ලෙන් ද්වාරයෙහි ආරක්ෂාවට මෙන් ම ධර්මශාලාවක් ලෙස භාවිත කිරිම සඳහා ඉදිරි පස කොටස ඇලුමිනියම් සෙවිලි තහඩු වසා සිමෙන්තියෙන් නිර්මාණය කොට ඇත. බ්‍රිතාන්‍ය පාලන සමයෙහි නිර්මාණය කළ ගල් බැම්මකින් ධර්ම ශාලාව පිහිටි කොටස ආරක්ෂිත ය. පැරණි පියගැට පෙළ එම ගල් බැම්ම සමඟ තිබී ඇති නමුත් දැනට එය වසා දමා ඇත. ලෙන් විහාරයට ඇතුළුවීම සඳහා යොදා ඇති දොරටුව හා උළුවස්ස මහනුවර අවධියට අයත් බව පෙනෙයි.

ලෙන් විහාරයට ඇතුළුවන්නෙකු හට ඉදිරියෙහි ඇති බිත්තියෙහි නිර්මාණය කර තිබෙන වීරාසන මත සමාධි ඉරියව්වෙන් වැඩ සිටින බුද්ධ ප්‍රතිමා තුනක් දැක ගැනීමට හැකි ය. එම ප්‍රතිමා ත්‍රිත්වයට වම් පසින් හිටි බුද්ධ ප්‍රතිමාවක් හා ප්‍රතිමාවට දකුණු පසින් විෂ්ණු දේව ප්‍රතිමාවක් දක්නට ලැබේ. ලෙන් විහාරය අපූරු පිහිටීමකින් යුක්ත ය. හිටි බුද්ධ ප්‍රතිමාව හා දේව ප්‍රතිමාව සහිත බිත්තිය, දොරටුව ඉදිරි පස ඇති හිඳි බුද්ධ ප්‍රතිමා තුන වැඩ සිටින බිත්තිය, මුචලින්ද නාග දරණය මෙන් ම හිඳි ඉරියව්වෙන් යුතු තවත් බුද්ධ ප්‍රතිමාවකින් හෙබි බිත්තිය හා හිඳි ඉරියව්වෙන් යුතු බුද්ධ ප්‍රතිමාවක් සහිත බිත්තිය වශයෙන් මෙය බෙදා

වෙන් කළ හැකි ය. දොරටුව පිහිටි බිත්තිය ලෙනෙහි ඉදිරි පස ආවරණය සඳහා සකස් කළ එකකි. මුචලින්ද නාග දරණය දැක්වෙන බුද්ධ ප්‍රතිමාව හා ඒ අසල ඇති හිදි බුද්ධ ප්‍රතිමා දෙක ලෙනෙහි අනෙක් කොටස්වලට වඩා අඩි හතරක් පමණ ඉහළින් මණ්ඩපයක් බඳු වූ කොටසක පිහිටියේ ය. මෙය ස්වභාවයෙන් ම ලෙන පිහිටා තිබෙන ආකාරය හේතුවෙන් සැකසුනකි. ලෙනෙහි ස්වභාවික පිහිටීම කලාකරුවා විසින් මනාව හසුරුවා ඇති ආකාරය එහි යන අයෙකු හට පසක් වනු ඇත. ලෙන් විහාරය සතු සිතුවම්වලින් වැඩි කොටසක් එහි දොරටුව සහිත බිත්තියේ දෙපස සකසා තිබේ. මීට අමතර ව වියන් තලයෙහි හා බුද්ධ ප්‍රතිමා අතර පිහිටි බිත්තිවල ද සිතුවම් නිර්මාණය කොට ඇත.

## ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය ක්ෂේත්‍රය හා සබැඳි සිතුවම් පරීක්ෂා කිරීම මත සිදු වූවකි. වර්ණ භාවිතය හා සිතුවම් තේමා පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන ලදි. ලෙනෙහි ඉහළ කොටස්වල පිහිටි පියවි ඇසින් නැරඹිය නොහැකි සිතුවම් කැමරා තාක්ෂණය උපයෝගී කරගනිමින් ලබාගත් ඡායාරූප ඇසුරු කර ගනිමින් නිරීක්ෂණය කරන ලදි.

## සාකච්ඡාව හා ප්‍රතිඵල

දොරටුවෙන් ඇතුළුවන්නෙකුගේ දකුණු පසින් තිරස් හා සිරස් තීරු මත නිර්මාණය කළ සූවිසි විවරණය, නාලාගිරි දමනය, සංඝරාජ හිමිගේ රුව හා නෙළුම් මල් මෝස්තර යන සිතුවම් දැක ගත හැකි ය. දොරටුවට ඉහළින් තිරස් තීරු දෙකක සූවිසි විවරණයේ අවස්ථා නිරූපණය කොට ඇත. දොරටුව සමග ම ඇති ඍජු කෝණාස්‍රාකාර තීරුව නෙළුම් මල් මෝස්තරයකින් අලංකෘත ය. ඉහළ සිට තෙ වැනි තිරස් තීරුවෙහි නාලාගිරි දමනයේ අවස්ථා අලංකාරවත් ව නිරූපිත ය. මෙහි නාලාගිරි ඇතුට රා පෙවීමේ අවස්ථාව පළමු වැනි කොටසින් නිරූපනය කර ඇත. ඍජු කෝණාස්‍රාකාර හැඩයෙන් යුතු එම කොටසෙහි රජකීය ඇත් ගාලේ දී ඇතුට රා පොවන ආකාරය අලංකාර හා සිත්ගන්නාසුලු අයුරින් නිර්මිත ය. මහනුවර අවධියේ ක්‍රියාත්මක වූ ඇත් ගාලක ස්වරූපය හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ කදිම නිදර්ශනයක් ද මෙම සිතුවමින් සැපයනු ලැබේ. එම කථා පුවතෙහි අනෙක් අවස්ථා ඊට පහළ තීරුවේ දකුණේ සිට වමට නිමවා තිබේ. කෝපාවිෂ්ට ව නගරය දෙවනත් කරමින් බුදුරදුන් ඉදිරියට යන නාලාගිරි රුව මෙහි දෙ වැනි අවස්ථාවෙන් නිරූපණය කර ඇත. නාලාගිරි ඇතු බුදුරදුන් ඉදිරියේ සිටින ආකාරය එහි තෙ වැනි අවස්ථාවයි. මෙම සිතුවම් කොටසෙහි බුදුරදුන් අර්ධ කවාකාර ආරුක්කු හැඩයෙන් යුතු කොටසක ඇඳ ඇත. බුදුරදුන්ගේ රුවට පසුව ආනන්ද හිමියන් දැක්වෙන රුවකි. නාලාගිරි ඇතු බුදුරදුන් ඉදිරියට පැමිණෙන අවස්ථාවේ ආනන්ද හිමි එය වැළැක්වීම උදෙසා ඉදිරියට පැමිණි බව බෞද්ධ සාහිත්‍යයේ විස්තරය. මේ එම අවස්ථාව නිරූපණය කිරීම උදෙසා ගත් ප්‍රයත්නයකි. නැවතත් ආරුක්කු හැඩයෙන් යුතු කොටසක

බුදුරදුන් සිතුවමට නඟා ඇති අතර පසුව රහත් රූ පෙළක් නිර්මාණය කොට ඇත. මෙම කථා පුවත් දැක්වෙන තීරුවෙන් පසු තිරස් තීරු දෙකක නෙළුම් මල් මෝස්තර නිරූපිත ය. දොරටුව ආසන්න සිරස් තීරුවක වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ රුව යැයි විශ්වාස කළ හැකි භික්ෂු රූපයක් දැකගත හැකි ය.

ලෙන් විහාරයට ඇතුළු වන්නාගේ වම් පසින් පිහිටි බිත්තිය තිරස් තීරු එකොළහකට බෙදා සිතුවම් නිර්මාණය කර ඇත. දකුණු පස ඉහළ තිරස් තීරුවේ ඇඳ ඇති සූවිසි විවරණයේ ම දිගුවක් ලෙස වම් පස ඉහළ තිරස් තීරුව සැලකිය හැකි ය. ඊට පහළ තීරුව වෙන්ව ඇත්තේ දොරටුවට ඉහළින් ඇති නෙළුම් මල් මෝස්තරයේ ම දිගුවක් ලෙස ය. ඊට පහළ තිරස් තීරු හයක බුද්ධ චරිතයේ විශේෂ අවස්ථා සිතුවම් කොට ඇත. පහළ ම තිරස් තීරු ත්‍රිත්වය වෙන්ව ඇත්තේ වෙස්සන්තර ජාතකය සඳහා ය. වියන් චිත්‍රවල ප්‍රධාන තේමාව වී ඇත්තේ දස මාර පරාජයයි. මීට අමතර ව හිඳි බුද්ධ ප්‍රතිමා ත්‍රිත්වයට ඉහළ වියන් තලය තේමේය (තේමිය) ජාතකය සඳහා වෙන් ව ඇත. එහි අවසාන සිදුවීම පමණක් පැහැදිලි ව දැකගත හැකි නමුත් අනෙක් සිතුවම් අවපැහැ ගැන් වී ක්ෂය වී ගොස් ඇති ආකාරයක් පෙන්වයි. ප්‍රතිමා අතර හිඩැස් පිරවීම සඳහා මල් ලියකම් මෝස්තර යොදා ගෙන ඇත.

මහනුවර නගරය කේන්ද්‍ර කරගත් ප්‍රකට විහාරස්ථාන බොහෝමයක දැකගත හැකි මහනුවර සම්ප්‍රදායේ සිතුවම් පිළිබඳ ප්‍රාමාණික අධ්‍යයනය සිදු කර ඇති නමුත් ප්‍රාදේශීය ව පිහිටි විහාරස්ථාන පිළිබඳ ව යොමු කර ඇති අවධානය අඩු මට්ටමක පවතියි. කැලණිය, මුල්ගිරිගල, තෙල්වත්ත වැනි විහාර පිළිබඳ ව යම් අවධානයක් පසු කාලීන පර්යේෂකයින් විසින් යොමු කර තිබුණ ද අනුරාධපුරය (නුවර කලාවිය) වැනි ප්‍රදේශාශ්‍රිත ව පැවති මහනුවර සම්ප්‍රදායේ වෙහෙර විහාරස්ථාන ඊට ඇතුළත් වී ඇති බවක් නොපෙනෙයි. නුවරකලාවියෙහි ස්ථානගත වී පවතින මහනුවර අවධියට අයත් විහාරස්ථාන ප්‍රමාණය අතින් බැලූ විට කුරුණෑගල, කෑගල්ල, රත්නපුර, මහනුවර වැනි දිස්ත්‍රික්කවල දැකිය හැකි විහාරස්ථානවලට වඩා අඩු ගණනයකින් යුක්ත වේ. ඇතැම් විහාරස්ථාන අවධානය මදකම හේතුවෙන් හා බලධාරීන්ගේ අවධානය නිසි කල යොමු නොවීමෙන් මෑත භාගයේ දී විනාශ වී තිබේ. ව්‍යසනකාරී තත්ත්වයකට පත්වෙමින් ඇති ගල්කිරියාගම වනසිංහාරාම ලෙන් විහාරයෙහි සිතුවම් නුවරකලාවියට අයත් එවැනි සිතුවම් පවතින ආකර්ෂණීය ස්ථානයක් ලෙස සැලකීම වරදක් නොවේ. ලෙනෙහි පිහිටීම තම සිතුවම් සඳහා මනා ලෙස යොදා ගත් ආකාරය කෙරෙහි අවධානය යොමු කරන්නෙකුහට වනසිංහාරාමය කදිම නිදසුනකි.

මෙම ක්‍රමවේද ඔස්සේ දිවෙන පර්යේෂණයේ දී ගල්කිරියාගම වනසිංහාරාම ලෙන් විහාරය සතු සිතුවම් නුවරකලාවියෙහි දැකිය හැකි

මහනුවර අවධියට අයත් විශිෂ්ට නිර්මාණ ගොනුවක් සේ හඳුනා ගනු ලැබිණි. නුවරකලාවියෙහි දැකිය හැකි තත් අවධියට අයත් බොහෝ විහාරයන්හි සූවිසි විවරණය පොදු තේමාවක් සේ යොදා ගෙන ඇත. හිඩැස් පිරවීම සඳහා ලියවැල් ආදී සාම්ප්‍රදායික මෝස්තර දැකිය හැකි වන නමුත් ජාතක කථා හා සිදුහත් බෝසතුන්ගේ චරිතයෙහි විශේෂ අවස්ථා සිතුවමට නඟා ඇති ආකාරයක් අනෙකුත් විහාරස්ථානයන්හි දැකගැනීමට නොහැකි ය. එබැවින් නුවරකලාවියෙහි ඇති මහනුවර අවධියට අයත් විශිෂ්ටතම සිතුවම් නිර්මාණ සහිත විහාරස්ථානය ලෙස වනසිංහාරාමය සැලකීම යෝග්‍ය ය.